# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/7 - 2017 ජුනි මස 19 වැනි සඳුදා - 2017.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24 (2) (1) (xiii) හා 24 (3) සහ මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 20 වෙනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝග

මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම වර්ෂ 1992 අංක 4 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24 (2) (1) (xiii) වගන්තිය හා මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රඥප්තියේ 19 (ණ) හා (ට) වගන්ති සමග කියවිය යුතු 20 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන රියදුරු පුහුණු පාසලේ පුහුණුව ලැබීම සඳහා එක් ආධුනිකයෙකුගෙන් ඒ ඒ වාහන පන්ති වලට අදාළව ගාස්තු පහත සඳහන් පරිදි අයකරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ගාස්තු අය කිරීම 2017.05.22 දින සිට ක්‍රියාත්මක වේ.

| *වාහන පන්තිය* | | *ගෙවිය යුතු ගාස්තු* |
|---|---|---|
| යතුරු පැදි, වෑන්රථ, ත්‍රිරෝද රථ | (A, B, BI) | රු. 14,000.00 |
| යතුරු පැදි | (A) | රු. 3,500.00 |
| වෑන් රථ | (B) | රු. 10,000.00 |
| ත්‍රිරෝද රථ | (BI) | රු. 4,000.00 |
| ත්‍රිරෝද රථ, යතුරු පැදි | (BI, A) | රු. 7,000.00 |
| යතුරු පැදි, වෑන් රථ | (A, B) | රු. 13,000.00 |
| වෑන් රථ, ත්‍රි රෝද රථ | (B, BI) | රු. 13,000.00 |

එදිරිවීර වීරවර්ධන,<br>
මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන,<br>
ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,<br>
මධ්‍යම පළාත.

07 - 68


1A - PG 3575 — 22 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*